www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1 hour

| 11 | S | I |
|---|---|---|

## Buddhism – I

බුද්ධ ධර්මය – I

Name :- ................................................... Grade : -................ Index number:-...................

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ❖ **වඩාත් නිවැරදි පිළිතුරට හිමි වරණය තෝරා (x) ලකුණ යොදන්න.**
- ❖ **අපහැදිලි පිළිතුර කපා හරිනු ලැබේ**

1. මාළිගාවෙන් පිටත ලෝකයේ යථාර්ථය දැකීමේ අදහසින් රාජය උයනට යන සිද්ධාර්ථ කුමරුන්ට මග දී සතර පෙර නිමිති දක්නට ලැබුණි. ඒවා පිළිවෙළින්,
   (1) ලෙඩෙක්, මහල්ලෙක්, මළ කඳක්, පැවිදි රුවක් ය.
   (2) මහල්ලෙක්, ලෙඩෙක්, මළ කඳක්, පැවිදි රුවක් ය.
   (3) මළ කඳක්, ලෙඩෙක්, මහල්ලෙක්, පැවිදි රුවක් ය.
   (4) පැවිදි රුවක්, මහල්ලෙක්, මළ කඳක්, ලෙඩෙක් ය.

2. සිදුහත් බෝසතුන්ගේ ශාන්ත බව හා රූපශ්‍රීය දැක ''මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති'' යනාදි වශයෙන් කරන ලද ප්‍රකාශය හැඳින්වෙන්නේ,
   (1) ථෙරි ගාථා නමින් ය. (2) නරසීහ ගාථා නමින් ය.
   (3) නිබ්බුත පද නමින් ය. (4) උදාන නමින් ය.

3. සිද්ධාර්ථ කුමාර අවධිය අභියෝගවලින් පිරුණෙකි. සිදුහත් බෝසත් කුමරුට මුහුණ දීමට සිදු වූ අභියෝගයක් නොවන්නේ,
   (1) පස්කම් සුව අත්හැරීම. (2) තනතුරු පිරිනැමීම.
   (3) සතර පෙර නිමිති දැකීම. (4) ශිල්ප හැදෑරීම.

4. ''බුදු ගුණ අනන්තය'' ඒ බුදුගුණ අතරින් ආලවක කුමාරයාටත්, අංගුලිමාලටත් පිහිට වීමෙන් පිළිබිඹු වන බුදු ගුණ වන්නේ,
   (1) අසරණ සරණ ගුණය හා පුරිසදම්ම සාරථී ගුණය
   (2) පුරිසදම්ම සාරථී ගුණය හා අසරණ සරණ ගුණය
   (3) තාදී ගුණය හා පුරිසදම්ම සාරථී ගුණය
   (4) ගිලනුන්ට උපස්ථාන කිරීම හා පුරිසදම්ම සාරථී ගුණය

5. සුන්දර වූ ගමන් ඇති හෙයින් ද, යහපත් වචන පවසන හෙයින් ද, සුන්දර වූ නිවනතට පැමිණි හෙයින් ද බුදුරජාණන් වහන්සේ,
   (1) භගවා නම් වන සේක. (2) ලෝකවිදූ නම් වන සේක.
   (3) අරහං නම් වන සේක. (4) සුගත නම් වන සේක.



agaram.lk

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. අප මහා බෝසතාණන් වහන්සේ ''සත්‍ය පාරමිතාව'' පිරූ ආකාරය හෙළි වන ජාතක කතාව වන්නේ,
   (1) තේමිය ජාතකය යි. (2) ලෝමහංස ජාතකය යි.
   (3) මහා කපි ජාතකය යි. (4) වට්ටක ජාතකය යි.

7. බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය අන්තර්ගත කොට පස්වග තවුසන් අමතා දේශනා කළේ,
   (1) අනන්ත ලක්ඛණ සූත්‍රය යි. (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
   (3) දම්සක් පැවතුම් සූත්‍රය යි. (4) පරාභව සූත්‍රය යි.

8. තණ්හාවෙන්, මානයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් පිරිය යුතු ගුණ ධර්ම වන්නේ,
   (1) පාරමිතාවන් ය. (2) සමාධිය යි. (3) සීලය යි. (4) භාවනාව යි.

9. ගැබිනි මාතාවන්ගේ දරු ප්‍රසූතිය පහසු කිරීම උදෙසා භික්ෂූන් වහන්සේලා දේශනා කරනු ලබන පිරිත වන්නේ,
   (1) ජය පිරිත යි. (2) අංගුලිමාල පිරිත යි.
   (3) වැසි පිරිත යි. (4) ධජග්ග පිරිත යි.

10. බුද්ධාදී ත්‍රිවිධ රත්නයෙහි ගුණ අවබෝධ කොටගෙන ඇති වන ප්‍රසාදය හෙවත් පැහැදීම බුදු දහමේ හැඳින්වෙන්නේ,
   (1) බුද්ධාලම්භනය නමිනි. (2) අමූලික ශ්‍රද්ධාව නමිනි.
   (3) ආකාරවතී ශ්‍රද්ධාව නමිනි. (4) ආගමික භක්තිය නමිනි.

11. යමක් කිරීමෙන් පසු පසුතැවෙන්නට සිදු වන ක්‍රියා නොකරන්නට උපදෙස් ලබා දෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,
   (1) නතං කම්මං කතං සාධු යන්න යි. (2) අත්තනාව කතං පාපං යන්න යි.
   (3) සුකරානි අසාධූනි යන්න යි. (4) තංච කම්මං කතං සාධූ යන්න යි.

12. තිදොරින් සිදුවන අකුසල කර්මවලින් ''මනෝ කර්ම'' වලට අයත් වන්නේ,
   (1) පිසුනා වාචා යි. (2) අදත්තා දානය යි.
   (3) ප්‍රාණඝාතය යි. (4) මිත්‍යාදෘෂ්ටිය යි.

13. කර්මයේ බලපෑම කොතරම් තීරණාත්මක වුව ද ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් ක්‍රියා කිරීමෙන් ඇතැම් කර්ම විපාක මඟහරවා ගත හැකි ය. එය හඳුන්වන්නේ,
   (1) කාල සම්පත්තිය නමිනි. (2) ප්‍රයෝග සම්පත්තිය නමිනි.
   (3) උපධි සම්පත්තිය නමිනි. (4) ගති සම්පත්තිය නමිනි.

14. විපාක දීමට ඉදිරිපත් වන අනුපිළිවෙළ අනුව සිව් ආකාර වන කර්ම අතුරෙන් බලවත් චේතනා ශක්තියකින් තොරව සිදු කරන කර්ම,
   (1) ආසන්න කර්මය යි. (2) කටත්තා කර්මය යි.
   (3) ගරුක කර්මය යි. (4) ආචිණ්ණ කර්මය යි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!





agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

15. ''අනිච්චා වත සංඛාරා උප්පාද වය ධම්මිනෝ.....'' යනාදී ගාථාව ඇසෙන විට අපට සිහිපත් වන්නේ,
    (1) ත්‍රිලක්ෂණ ධර්මය යි. (2) චතුරාර්ය සත්‍ය ධර්මය යි.
    (3) පටිච්චසමුප්පාද ධර්මය යි. (4) ත්‍රිශික්ෂා ධර්මය යි.

16. යම්කිසි පුද්ගලයකු හෝ වස්තුවක් පිළිබඳව හෝ යම් ක්‍රියාවක් ගැන හෝ අප්‍රිය ස්වභාවය, විරුද්ධ ස්වභාවය හැඳින්වෙන්නේ,
    (1) යසස නමින් ය. (2) අභිද්‍යාව නමින් ය.
    (3) ව්‍යාපාද නමින් ය. (4) ක්ෂාන්තිය නමින් ය.

17. සියලු කෙලෙසුන් දුරු කිරීමේ නුවණ ලබා ගැනීමට විදර්ශනා භාවනාව වැඩිය යුතු වේ. එම නුවණ හැඳින්වෙන්නේ,
    (1) දිබ්බ චක්ඛු ඥානය නමින් ය. (2) පඤ්ච අභිඥා නමින් ය.
    (3) පුබ්බේනිවාසානුස්සති ඥානය නමින් ය. (4) ආසවක්ඛය ඥානය නමින් ය.

18. සියම් දේශයේ රජු විසින් උපාලි මහතෙරුන් ප්‍රධාන උපසම්පදාලාභී භික්ෂූන් විසිනමක් ලක්දිවට එවීමෙන් අනතුරු මෙරට ''සියම් මහා නිකාය'' ආරම්භ විය. එකල ලක්දිව පාලකයා,
    (1) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය. (2) විජයබාහු රජු ය.
    (3) නිශ්ශංකමල්ල රජු ය. (4) හතරවැනි පරාක්‍රමබාහු රජු ය.

19. දුටුගැමුණු මහ රජතුමා විසින් ඉදි කරන ලද විහාරාරාංගවලට අයත් නොවන්නේ,
    (1) ලෝවාමහාපාය යි. (2) රුවන්වැලි මහ සෑය යි.
    (3) ථූපාරාමය යි. (4) මිරිසවැටිය යි.

20. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවෙන් සමන්විත වේ. එහි සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග අයත් වන්නේ,
    (1) සමාධියට යි. (2) අනාත්මයට යි. (3) ප්‍රඥාවට යි. (4) සීලයට යි.

21. සිඟාලෝවාද සූත්‍රගත යුතුකම් හා වගකීම්වලට අනුව ගරු කිරීමත්, අවමන් නොකිරීමත්,
    (1) දරුවන්ගේ යුතුකමකි. (2) ශිෂ්‍යයාගේ යුතුකමකි.
    (3) ස්වාමි පුරුෂයාගේ යුතුකමකි. (4) සේවකයාගේ යුතුකමකි.

22. සිඟාල ගෘහපතියාට දේශනා කළ සදිසා නමස්කාරයේ ''උවදුරුවලින් එතෙර කරනවාය'' යන අර්ථය ඇතිව දක්වූ සදිසාව වන්නේ,
    (1) දකුණු දිසාව යි. (2) උතුරු දිසාව යි.
    (3) නැගෙනහිර දිසාව යි. (4) උඩ දිසාව යි.

23. දීර්ඝ කාලයක් තිස්සේ විජාතිකයන්ට යටත්ව සිටීම නිසා යටපත් වී ගිය ජාතික ආගමික අභිමානය ගොඩනැගුවේ අනගාරික ධර්මපාලතුමා ය. එතුමා සිදු කළ මෙහෙයක් වන්නේ,
    (1) බරණැස මූලගන්ධ කුටි විහාරය ඉදි කිරීම.
    (2) සරසවි සඳරුස පුවත්පත ආරම්භ කිරීම.
    (3) පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම.
    (4) මහනුවර නියම කන්දේ පිරිවෙන ආරම්භ කිරීම.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

24. බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේ මෙලොව පරලොව හිත පිණිස හේතු වන කරුණු ඇතුළත්ව දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කළ සූත්‍රය වන්නේ,
   (1) පරාභාව සූත්‍රය යි.   (2) ධම්මික සූත්‍රය යි.
   (3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.   (4) මහා මංගල සූත්‍රය යි.

25. මිනිසුන් රාගයෙන් රාගයට ම, ද්වේශයෙන් ද්වේශයට ම, මෝහයෙන් මෝහයට ම යති. මේ පිළිවෙත,
   (1) අනුසෝතගාමී ය.   (2) කාමසුඛල්ලිකානු යෝගය යි.
   (3) අත්තකිලමතානු යෝගය යි.   (4) පටිසෝතගාමී ය.

26. අසත්පුරුෂයන් ප්‍රියවීම, අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම කෙනෙකු තුළ ඇත්නම් ඔහු තුළ ඇත්තේ,
   (1) මංගල කරුණු ය.   (2) දියුණුවට හේතුවන කරුණු ය.
   (3) වසල කරුණු ය.   (4) පරාභව කරුණු ය.

27. ''සමගි වන්න විවාද නොකරන්න'' යන අදහස ඇතුළත් උතුම් බුදු වදන වන්නේ,
   (1) සමග්ගා හෝථ මා විවදථ   (2) සන්තුට්ඨි පරමං ධනං
   (3) සමග්ගා හෝති බ්‍රාහ්මණෝ   (4) සමවායෝ එව සාධු

28. බුදුරජාණන් වහන්සේට දෙව්රම් වෙහෙර පූජා කරන ලද්දේ,
   (1) විශාඛා සිටු දියණිය ය.   (2) බිම්බිසාර රජතුමා ය.
   (3) සුදත්ත සිටුවරයා ය.   (4) කෝසල දේවිය ය.

29. අසරණ වූ පිරිස් සොයා ගෙන වැඩම කොට ඔවුනට පිහිට වීම බුදුරජාණන් වහන්සේගේ පිළිවෙතකි. එසේ වැඩම කිරීම,
   (1) විශේෂ චාරිකාව යි.   (2) ආබද්ධ චාරිකාව යි.
   (3) ධම්ම චාරිකාව යි.   (4) නිබද්ධ චාරිකාව යි.

30. භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගේ ප්‍රත්‍ය පහසුකම් ලබා ගත යුතු ආකාර පැහැදිලි කළ උපමාව වන්නේ,
   (1) බඹරා මල නොතලා රොන් ගන්නා සේ ය.   (2) වේයා තුඹස බඳින්නා සේ ය.
   (3) පියාපත් බර කුරුල්ලා සේ ය.   (4) අටවකට පායන අඩ සඳ සේ ය.

31. දුක සැප විඳදරා ගැනීමේ සමබර මානසිකත්කයක් ගොඩනගා ගැනීමට හැකියාව ලැබෙන බෞද්ධ ඉගැන්වීම වන්නේ,
   (1) අටලෝ දහමින් කම්පා නොවීම යි.   (2) අනිත්‍යතාව අවබෝධ කර ගැනීම යි.
   (3) කර්මය පිළිබඳ හැදෑරීම යි.   (4) චතුරාර්ය සත්‍ය අවබෝධය යි.

32. සත්‍යාවබෝධය සඳහා බෝසතාණන් වහන්සේ තෝරාගත් උරුවෙළෙහි සේනානිගම පිළිබඳ බුද්ධත්වයෙන් පසු සිත්කලු ලෙස වර්ණනා කරන ලද සූත්‍රය වන්නේ,
   (1) සිංසපා සූත්‍රය   (2) සාමඤ්ඤඵල සූත්‍රය
   (3) අරියපරියේසන සූත්‍රය   (4) ධනිය ගෝපාල සූත්‍රය



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

33. බුද්ධ දේශනාවට අනුව ලොව පවත්නා බලවත්ම රෝගය වන්නේ,
    (1) පිළිකාව යි. (2) කුසගින්න යි.
    (3) පිත්ත රෝගය යි. (4) අංශභාගය යි.

34. කම්මට්ඨනාචාර්යවරයෙකු වෙත පැමිණි යෝගියා තුළ මුලාව, මෝඩකම අධික බව ප්‍රදර්ශනය විය. ඔහු තුළ ඇති චරිත ලක්ෂණය වන්නේ,
    (1) විතර්ක චරිතය යි. (2) මෝහ චරිතය යි.
    (3) රාග චරිතය යි. (4) දෝස චරිතය යි.

35. සමාජයේ බොහෝ දෙනා අතර ඇති ප්‍රශ්න සියයකට පිළිතුරු සපයමින් රේරුකානේ චන්දවිමල මහා නාහිමියන් රචනා කරන ලද ධර්ම ග්‍රන්ථය,
    (1) අභිධර්ම මාර්ගය. (2) පාරමිතා ප්‍රකරණය.
    (3) පොහොය දිනය. (4) ධර්ම විනිශ්චය.

36. සදාචාරාත්මක සංවර්ධනයක් සඳහාත් තිරසාර පිරිපුන් සංවර්ධනයක් සඳහාත් ගිහි ජනයා විසින් ආරක්ෂා කළ යුතු නිත්‍ය ශීලය වන්නේ,
    (1) ප්‍රාතිමෝක්ෂ සංවර සීලය යි. (2) ගේහසිත සීලය යි.
    (3) දස සීලය යි. (4) උපෝසථ සීලය යි.

37. ත්‍රිවිධ ශික්ෂාවන් අතර ද, සප්තාර්ය ධනය අතර ද, දස පුණ්‍ය ක්‍රියා අතර ද, දසරාජ ධර්ම අතර ද එන උසස් ගුණ ධර්මය වන්නේ,
    (1) භාවනාව (2) තපස (3) ශීලය (4) ශ්‍රද්ධාව

38. කර්මය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව ප්‍රවෘත්ති විපාක දෙන ජනක කර්මයට බාධා පමුණුවන කර්මය හඳුන්වනු ලබන්නේ,
    (1) උපඝාතක කර්ම ලෙස ය. (2) කටත්තා කර්ම ලෙස ය.
    (3) ආචිණ්ණ කර්ම ලෙස ය. (4) උපපීඩක කර්ම ලෙස ය.

39. සසර ජීවත් වන අපට නොයෙක් දේ ලැබේ. ආයු, වර්ණ, සැප, බල ලැබෙන පිංකමක් වන්නේ,
    (1) වතාවත් කිරීම ය. (2) දන් දීම ය.
    (3) භාවනා කිරීම ය. (4) සිල් රැකීම ය.

40. මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් මත බුදු රදුන්ගේ අකු ධාතූන් තැන්පත් කර දෙවන පැතිස් රජු ඉදිකළ ස්තූපය,
    (1) මියුගුණ සෑය යි. (2) ථූපාරාමය යි.
    (3) කණ්ඨක චෛතිය යි. (4) ගිරිහඬු සෑය යි.

(ලකුණු 1 x 40 = 40)





agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :1 hour

| 11 | S | II |
|---|---|---|

## Buddhism – II

## බුද්ධ ධර්මය – II

Name :- ..................................................... Grade : -................ Index number:-...................

- ❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**
- ❖ **ප්‍රශ්න අංකය හා අනු අංක පැහැදිලිව සටහන් කරන්න.**
- ❖ **සෑම ප්‍රශ්නයක් අලුත් පිටුවකින් ආරම්භ කරන්න.**

(1) (i) බුදු සිරිතේ අභියෝග දෙකක් නම් කරන්න.

(ii) ''සතිසම්පජඤ්ඤා'' හා ''සන්තුට්ඨිතා'' යන ගුණාංග දෙකේ අර්ථය ලියන්න.

(iii) කුසල් යන්නෙහි අදහස් දෙකක් ලියන්න.

(iv) අතිපූජ්‍ය රේරුකානේ ස්වාමීන් වහන්සේගේ ගිහි කල නම කුමක් ද?

(v) ''යේ ධම්ම හේතුපභවා....'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

(vi) ඉපදීම නිසා සත්ත්වයාට විඳීමට සිදු වන දුක්ඛයන් දෙකක් නම් කරන්න.

(vii) ධම්මපදය අයත් පිටකය හා නිකාය දක්වන්න.

(viii) ආගම් භේදයකින්, ජාති භේදයකින් තොරව අනුගමනය කළ හැකි බෞද්ධ ඉගැන්වීම් දෙකක් නම් කරන්න.

(ix) මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද දෙකක් ලියන්න.

(x) ත්‍රිපිටකය සඳහා සිංහලෙන් ලියන ලද අටුවා ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

(2) (i) ''නතං කම්මං කතං සාධු.....'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) අප කළ යුතු, නොකළ යුතු දෑ මොනවාදැයි ධම්මපද දේශනා ඇසුරින් පැහැදිලි කරන්න.

(3) (i) සිදුහත් බෝසතාණන්ට ලොව්තුරා බුද්ධත්වයට පත්වීමට උපකාරී වූයේ කුමක් ද?

(ii) ''අනේක ජාති සංසාරං.....'' යන ගාථාවේ තේරුම ලියන්න.

(iii) පාසල් සිසු සිසුවියන් වශයෙන් අපට ජීවිතයේ මුහුණදීමට සිදුවන විවිධ අභියෝගවලින් ජයගන්නා ආකාරය විස්තර කරන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(4) (i) ''පටිච්චසමුප්පාදය'' යන යෙදුමෙන් කියැවෙන අර්ථ දෙකක් ලියන්න.

(ii) බුදුරජාණන් වහන්සේ විසින් පටිච්චසමුප්පාද දේශනාව කිරීමේ අරමුණු මොනවා ද?

(iii) ''එක්තරා නගරයක වෙළඳසැලක් හොරු කැඩුවෝ ය.'' එම සිදුවීම හේතුඵල ධර්මයට අනුව විග්‍රහ කොට දක්වන්න.

(5) (i) ''විරමණය හා සමාදානය'' යන වචනවල අර්ථය ලියන්න.

(ii) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස තුනක් ලියන්න.

(iii) සිල්වත් වීමෙන් පෞද්ගලික හා සමාජ යහපත ඇතිවන බව පෙන්වා දෙන්න.

(6) (i) පාරමිතා යනු මොනවා ද?

(ii) ''දානං සීලං ච .....'' ගාථාව සම්පූර්ණ කරන්න.

(iii) පාරමී ධර්ම සමාජ ජීවිතයට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ තෙරණුවෝ

(ii) සඳකඩ පහණ

(iii) අනිත්‍ය ලක්ෂණය

(iv) විදර්ශනා භාවනාව

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk